# වැලිගම නගර සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය සඳහා ලියාපදිංචි ආදේශක සෞඛ්‍ය කම්කරුන් 05 දෙනෙකු බඳවා ගැනීම.

**අධ්‍යාපන සුදුසුකම්**

8 ශ්‍රේණිය සමත්ව තිබීම.

**පොදු සුදුසුකම්**

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
II. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් සහා බල ප්‍රදේහය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
III. සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
IV. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.
V. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබූවකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

**වැටුප**

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු තනතුරට හිමි මාසික, මූලික වැටුපෙන් 1/30 ක් සේවයේ යෙදෙන දිනයන් සඳහා පමණක් ගෙවනු ලැබේ. ඊට අමතරව සේවයේ යෙදුණු දිනට හිමි ජීවන වියදම් දීමනාව ද ගෙවනු ලැබේ.

**ඉල්ලුම් කළ යුතු ආකාරය**

- අයදුම්කරු මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම් පත 2026.02.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, වැලිගම නගර සභාව, වැලිගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.2026.02.28 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
- අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ.
- අයදුම්පත සමග පහත සඳහන් සහතික වල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් සුදුසුකම් නොමැති සේ සැලකේ.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. ජාතික හැඳුනුම්පත
4. ග්‍රාම නිලධාරී සහතිකය
5. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
6. පළපුරුද්ද පිළිබඳ සහතික

2026.02.05 දින,
වැලිගම නගර සභා කාර්යාලයේදී.
දුරකථන අංකය - 0412250255

සභාපති,
වැලිගම නගර සභාව

(අයදුම්පත් හා වැඩිදුර තොරතුරු www.weligamauc.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක)

# සෞඛ්‍ය කම්කරු ආදේශක තනතුර සඳහා අයදුම්පත

1. අයදුම්කරුගේ නම ( මුලකුරු සමග) : ..........................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම : ..........................................................................
3. පෞද්ගලික ලිපිනය : ..........................................................................
4. දුරකථන අංකය : ..........................................................................
5. උපන් දිනය : ...............................................

වර්ෂය : ................................. මාසය : ................................... දිනය: ...................................

6. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස

වර්ෂය.................................... මාසය...................................... දිනය....................................

8. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................
9. විවාහක/අවිවාහක බව : ..........................................................................
10. ජාතිය : ..........................................................................
11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන් ද?

යන වග : ..........................................................................

12. අධ්‍යාපන සුදුසුකම්: ..........................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්: ..........................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුර තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

දිනය................................................ ................................................

අයදුම්කරුගේ අත්සන